**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව - 2020**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වනබැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපවේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජර්නල් සටහන් මඟින් සිදුකල ගැලපීම් මඟින් 2018 හා 2019 වර්ෂයන්හිදී ඉදිකරන ලද ගොඩනැගිලි වටිනාකම් රු.8,496,481 ක වැඩි අගයකින් ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | 2021 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල දරන ලද ප්‍රාග්ධන වියදම් වටිනාකම රු.2,828,946 ක් ප්‍රාග්ධනිත කිරීම අත්හැරී තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | 2021 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා පුස්තකාල පොත් ණයහිමි වෙන්කිරීම් වටිනාකම රු.113,111ක් වුවද, රු.1,101,028ක් ලෙස ගිණුම්වලට ගෙන තිබීම හේතුවෙන් රු.987,917ක් අඩුවෙන් ණයහිමි ප්‍රතිපාදන වෙන්කර තිබුණි. | පුස්තකාල පොත් වෙනුවෙන් සත්‍ය ණයහිමි වටිනාකම රු.1,131,110ක් විය යුතු බැවින් එය ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | 2021 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතුවේ. |

**1.6.2 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයන් 6කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා උපලේඛන අනුව වටිනාකම අතර රු.11,355,625 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, ශේෂ සසඳා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නොසැසඳීම් අවම කිරීමට කටයුතු කළ යුතු වේ. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.47,419,314 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.55,230,883 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ වරිපනම් බදු හා අක්කර බදු ආදායමින් රු.554,178 ක් 2021 දෙසැම්බර් 31 දිනටත් ලැබිය යුතුව තිබුණි. | ඉතිරි හිඟ මුදල් අය කිරීමට අවශ්‍ය පියවර ගනු ලබයි. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u> | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.5,258,490 ක් හා මුද්දර ගාස්තු රු.16,957,546 ක් 2021 දෙසැම්බර් 31 දිනටත් ලැබිය යුතුව තිබුණි. | ඉතිරි බදු මුදල් ද අයකර ගැනීමට අවශ්‍ය පියවර ගනු ලබයි. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජීව වායු ඒකක දෙකක් ඇතිකර තිබුණ අතර එම අංශය සඳහා කම්පැක්ටර් 01 ක්, ට්‍රැක්ටර් 01 ක් බේල් මැෂින් 01 ක් හා සබ්මිසබල් වතුර මෝටර දෙකක්ද යොදවා තිබුණි. මෙම ඒකක දෙක මගින් නිෂ්පාදිත දියර පොහොර ගොවිජනතාව අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් සමාලෝචිත වර්ෂය තුල අඩුමිලට අලවිකර තිබුණ අතර, උත්පාදනය වන ජීව වායුව යොදාගෙන මෙම අංශයේම ප්‍රයෝජනය සඳහා 5kw ජෙනරේටර් දෙකක් ක්‍රියාත්මක කර තිබුණි. වර්ෂය තුල රු.9,870,197 ක පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් දරා තිබූ අතර, වර්ෂය තුළ රු.77,475 ක ආදායමක් රැස්කරගන තිබුණි. | අපද්‍රව්‍ය විධිමත්ව රැස්කර නගර පවිත්‍ර කර බල ප්‍රදේශයේ පරිසරය හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම පළාත් පාලන ආයතනය සතු ප්‍රධාන කාර්ය භාරයක් වන එම වගකීමේදී අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළු පවිත්‍රතා කටයුතු වෙනුවෙන් ආදායම් අපේක්ෂාවෙන් තොරව පුළුල් සේවාවක් ලබාදීමට පළාත් පාලන ආයතනයට සිදුව ඇත. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේදී ලාභ නොලැබුවද ලැබෙන ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වයඹ පලාත් පාලන ආයතන ස්වයංක්‍රීය කරන (CAT 2020) වැඩ සටහන යටතේ මෘදුකාංග සකසා සැපයීම හා වසරක කාලයකට සේවා සැපයීම වෙනුවෙන් රු.983,000 ක්, කොටස් වශයෙන් ගෙවීමට 2019 ජූනි 18 දින ගිවිසුම්ගතවී මුළු වටිනාකමින් 45% ක් වන රු.442,350 ක් 2019 දෙසැම්බර් 31 දිනට පෙර ගෙවා තිබුණ ද, 2020 වර්ෂය තුල මෙම ගිවිසුමේ ඇතුලත් අනෙකුත් මෘදුකාංග කිසිවක් සකසා සැපයීම් කර නොතිබුණි. | 2019 වර්ෂයේදී වැඩ කොටස් 05කට අදාලව ගෙවීම් සිදු කර ඇත්තේ රු.442,350 ක් පමණි. 2020 වර්ෂය තුල කිසිදු ගෙවීමක් වැඩ කොටස් වලට අදාලව සිදු නොවූ අතර (2020 වර්ෂයේ ගෙවීම් සිදු කරන ලද්දේ සර්වර් පරිගණකයට පමණි.) ඉදිරියේදී ඉතිරි වැඩ කොටස් වලට අදාලව මෘදුකාංගය ස්ථාපනය, පුහුණුව, ක්‍රියාත්මක කිරීම සිදු කිරීමට අපේක්ෂිතව ඇත. ගිවිසුම්ගත හා සැලසුම් කළ පරිදි ඉටුකරගැනීමට නොහැකි වූයේ 2020 වර්ෂය පුරා රට තුල පැවති කොරෝනා වසංගත තත්ත්වයත් හේතුවෙනි. | ඉතිරි මෘදුකාංග ස්ථාපනය, පුහුණුව, ක්‍රියාත්මක කිරීම කාල ප්‍රමාදයකින් තොරව සිදුකළ යුතු වේ. |